## 2022 අගෝස්තු මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.08.12**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

I. ඩබ්ලිව්.ජී. උපුල් මහතා - ගරු සභාපති
II. විදාන ගමගේ සුදත් මහතා - ගරු උප සභාපති
III. කේ.එච්. ගාමිණී මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
IV. හර්ෂ උදය කුමාර ජයවීර මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
V. ඩබ්.කේ. ටෂිත සමිල මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
VI. ඒ.පී. ධම්මික මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
VII. ආර්.රජිත ප්‍රියදර්ශන මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
VIII. චතුමිණී විජේනායක මෙනවිය - ගරු ප්‍රාදේශීය සභා සභික
IX. ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
X. ආර්.කේ.එම්. රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
XI. පී.කේ. ආරියසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
XII. එන්.ජී. සරත් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
XIII. වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
XIV. චමින්ද ඩයස් වන්නිගේ මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
XV. ජී.එච්.ජී. නීටා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
XVI. ඒ.ඩබ්. නන්දා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික

**නොපැමිණීම -**

I. පී.එල්. වාලි ගුණරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
II. එල්.එච්. කුමුදු සුජීව මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
III. කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
IV. එම්.එල්.එම්. හනීෆා මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
V. ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
VI. වැල්ලගේ ජීවානි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
VII. ඩබ්.කේ. සිසිර කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ අගෝස්තු මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් දෙපල ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.07.08 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.07.08 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.07.08 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවිය යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. වාලි ගුණරත්න මහතා, ඩබ්.කේ. සිසිර කුමාර මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා, වැල්ලගේ ජීවානි මහත්මිය එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා අද දින මහා සභාව සඳහා ඔහුගේම අත්සනින් යුතුව නිවාඩු ලිපියක් යොමු කර තිබුණද, ඔහු මීට පෙරත් දිගින් දිගටම මහා සභාවට කිසිදු දැනුම් දීමකින් තොරව නොපැමිණ ඇති නිසා, ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව මාස 03 ක කාලයක් මහා සභාවට නොපැමිණියහොත්, සභික ධූරය අත්හැර ගියා සේ සලකා කටයුතු කළ හැකි බැවින්, ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යවා ඇති බැවින්, ඊට අදාළ පිළිතුරු ලිපිය සහ ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන අනුමැතිය අනුව ඉදිරි අවශ්‍ය කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

ගරු සභික, කපිල ඉන්ද්‍රජිත් මහතා ද දිගින් දිගටම මහා සභාවට නොපැමිණීම හේතුවෙන්, ඔහු සඳහා ද ඉහත පරිදි ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යවා ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන අනුමැතිය අනුව ඉදිරි කටයුතු සිදු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

II. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බවට වූ මතය විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් අංක එච්එම්බී/බී/ටීඅයිපීඑස්/05/21/06(i) හා 2022 ජුනි 21 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>විගණන දෙපාර්තමේන්තුව විසින් අප පාලනය කාලය තුළ මෙලෙස විගණන මත ලබා දීම පිළිබඳ අපට සතුටු විය හැකිය. මක් නිසාදයත් අප පාලන කාලය තුළ සිදු කරන්නා වූ සියලුම කාර්යයන් හා</u>

කර්තව්‍යයන් ගිණුම්කරණ මූල ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අප සභාවට මෙලෙස විගණන මත ලැබී ඇත. එසේම මෙකී සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කිරීමේ දී විනිවිදභාවයෙන් හා නිවැරදිව සිදු කිරීම තුළින් ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභික මඩුල්ලේම අභිමානය ආරක්ෂා කරමින් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටද අභිමානයක් ඇති කරමින්, සිදු කිරීමට තමාට හැකි වූ බවත් සතුටින් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම ඉහත කී සෑම කාර්යයක්ම ඉටු කිරීමේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභික මඩුල්ලෙන් සහ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහායට මාගේ ගෞරවණීය ස්තූතිය පුද කරන ලදී.

III. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ලෙස සේවය කරන කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මහත්මිය දැනට ඇයගේ පවුලේ සාමාජිකයින් සමඟ ස්වාමි පුරුෂයාගේ රැකියා ස්ථානයට අයත් කෘෂිකර්ම නිල නිවාසයක පදිංචිව සිටින බවත්, දැනට පවතින ඉන්ධන ගැටළුව හා ප්‍රවාහන පහසුකම් හේතුවෙන් බෙරලිහෙල සිට තිස්සමහාරාමය දක්වා පැමිණීම ඉතා අසීරු කාර්යයක් වන නිසා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උඩුවිල නිල නිවාසය ඇය වෙත ලබා දෙන ලෙස 2022.08.06 දිනැතිව ලිපියක් මගින් ඉල්ලීම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ස්ථාන මාරු වී යාමේදී හෝ විශ්‍රාම යාමේදී අනිවාර්යයෙන්ම නැවත ලබා දීමේ පදනම මත ඉහත නිල නිවාසයේ අලුත්වැඩියා කටයුතු නිම වූ පසු නිල නිවසය අදාළ නිලධාරිනිය වෙත ලබා දීමට කටයුතු කර, වැටුපෙන් නිවාස කුලී අය කිරීම සුදුසු බවට තීරණය කරන ලද අතර, මේ සඳහා ගරු මහා සභාවේ සියලුම සභිකයින්ද ඒකමතිකව එකඟ වන ලදී.

## (ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

I. හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලය විසින් අංක හ/හම්/කලාප/සැවි.05 හා 2022.08.01 දිනැතිව ''ග්‍රාමීය ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන-2021 යටතේ සංවර්ධනය කරනු ලබන පාසල්වල නම සංශෝධනය කිරීම'' යන මැයෙන් යුතුව එවා ඇති ලිපිය අනුව, හ/විද්‍යාර්ථ මහා විද්‍යාලය යන වර්තමාන නාමය වෙනුවට, ''හ/විද්‍යාර්ථ සෞභාග්‍යා මහා විද්‍යාලය ලෙස සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා දෙන ලෙසට ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලය විසින් එවා ඇති ලිපිය අනුව, හ/විද්‍යාර්ථ මහා විද්‍යාලයේ නාමය, ''හ/විද්‍යාර්ථ සෞභාග්‍යා මහා විද්‍යාලය ලෙස සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහා සභාවේ එකඟතාවය ලබා දෙන ලදී.

II. හම්බන්තොට ලංකා විදුලි බල මණ්ඩලය විසින් අංක දප/හම්/ලි08/වීපී ලාම්පු හා 2022.05.05, 2022.06.02, 2022.07.04 දිනැතිව ''අනවසර වීපී ලාම්පු සම්බන්ධවයි'' යන මැයෙන් යුතුව එවා ඇති ලිපිය අනුව, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාව මගින් නගර අලංකරණය වෙනුවෙන් යෝධකණ්ඩිය වැව රවුම, තිස්ස වැව රවුම, වීරවිල වැව රවුම හා පන්නෙගමුව සිට දෙබරවැව දක්වා කොන්ක්‍රීට් පාර ඔස්සේ වීපී ලාම්පු ස්ථාපිත කර ඇති බවත්, ඒ සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ විදුලි පද්ධතිය මගින් ලංකා විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීමකින් තොරව මනුගත නොවන පරිදි විදුලි සැපයුම ලබා ගෙන ඇති බැවින්, කඩිනමින් ඒ සඳහා මනුගත වන පරිදි විදුලිය ලබා ගැනීමට කටයුතු සිදු කරන ලෙසට දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 44 කින් යුත් පෞරාණික වටිනාකමකින් සමන්විත ප්‍රදේශයක් වන අතර, කෘෂිකර්මාන්තය මූලික කර ගත් ආර්ථික රටාවක් සහිත සංචාරක ආකර්ෂණය දිනා ගත් පුරවරයකි. ස්වභාව සෞන්දර්ය අතින් විශාල වටිනාකමක් පවතින මෙම ප්‍රදේශය තුළ ඉතා විශාල ධාරිතාවයකින් හෙබි පෞරාණික වටිනාකමක් සහිත විශාල වැව් 03 ක් තිස්සමහාරාම නගරයට ආසන්නව පිහිටා ඇති බැවින්, එම වැව් අවට ප්‍රදේශය රාත්‍රී කාලයට දැඩි අඳුරු ස්වභාවයක් පැවතීම සංචාරක කර්මාන්තයට දැඩි හානියක් සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.</u>

<u>ශ්‍රී ලංකාවේ දියුණු නාගරික ප්‍රදේශවල වීථි ආලෝකමත් කිරීමට අලංකාර වීථි පහන් යොදා ගනිමින් අලංකරණ කටයුතු සිදු කර ඇති අවස්ථාවන්වල ග්‍රාමීය ප්‍රදේශවල ද පවතින වැදගත් ස්ථාන අලංකාරවත් පවත්වාගෙන යාම ප්‍රාදේශීය සභාව සතු කාර්යයක් වන අතරම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 108 (අ) වගන්තිය ප්‍රකාරව වීථි ආලෝක කිරීම සභාව සතු කාර්යයක් බවද පෙන්වා ඇත.</u>

<u>ඒ අනුව, ඉහත සඳහන් වැව රවුම් සහ පන්නෙගමුව සිට දෙබරවැව දක්වා ප්‍රධාන පාර ඔස්සේ වීථි ලාම්පු සවි කිරීම සභාව මගින් සිදු කරන ලද සමාජ සත්කාරයක් (පොදු උපයෝගීතා සේවා පිහිටුවා පවත්වාගෙන යාම) වන බවත්, මේ සඳහා මනුගත වීමක් සිදු කිරීමට ප්‍රමාණවත් මුදල් සභාව සතුව නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.</u>

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ කාමර | 71 | පී. ලීලාවතී | පී.ඒ. නිරෝෂා ශ්‍යාමලී | මවගෙන් දියණියට |
| 2 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 23 | එච්.කේ. ලීලාවතී | නාලක වික්‍රමසිංහ | මවගෙන් පුතාට |
| 3 | තිස්ස නව වෙළඳ සංකීර්ණය තනිමහල | 45 | එච්.ඒ.ඩබ්. එම්.එන්. චන්ද්‍රසිරි | එච්.ආර්.ඒ. හේමලතා | ස්වාමියාගෙන් බිරිඳට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| I | තිස්සමහාරාම ගබඩාව සඳහා අත්‍යාවශ්‍ය ජල උපකරණ සහ තණ කොළ කපන මැෂින් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම | ආර්.එස්. ග්‍රෝබල් ට්‍රේඩර්ස් ආයතනය | 1421<br>2022.03.03<br>1371<br>2022.04.08 | 53,132.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. දෙබරවැව පොළ භූමිය අසල ඉමෙඩිරෝ ෆාමසිය අසලින් ඇති පිවිසුම් මාර්ගයේ ඇති වතුර රැඳෙන ස්ථානය අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා සංවර්ධනය කොට, ජලය බැස යන පරිදි කාණුවක් සකස් කිරීම සහා අරමුදලින් සිදු කිරීමටත්, අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන දැනට වැසි සමය පවතින බැවින්, මෙම කටයුත්ත කඩිනමින් සිදු කිරීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ABC මිශ්‍රණය - 3.0 Cube
- ගල් කුඩු - 1.0 Cube
- 222 x 111 x 80 mm ප්‍රමාණයේ Interlock Block (30 N/mm²) - 2500.00 Nr (Available)
- සිමෙන්ති (50 Kg Bag) - 11.0 Bag
- වැලි - 0.5 Cube
- ¾'' ගල් - 1.0 Cube
- Steel Plate (Formwork) (9'' පළල) - 120 Oft
- Concrete Mixer - 0.5 Ba

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. 2022 වර්ෂය සඳහා පහත සඳහන් ටෙන්ඩර් දේපළ වෙනුවෙන් බදු සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2022.06.16 දින මහා සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන 2022 අප්‍රේල්, මැයි සහ ජුනි මාස සඳහා බදු සහන ලබා දීම සුදුසු බවට යෝජනා වූ බැවින්, ඒ සඳහා අවශ්‍ය උපදෙස් සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යැවූ පසුව, එතුමිය විසින් දුරකතනයෙන් ලබා දුන් උපදෙස් පරිදි, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යැවීම සඳහා එක් එක් දේපළයන් සඳහා ලබා දෙන බදු සහන මුදල ගරු මහා සභාවේ තීරණය කර, අදාළ අනුමැතිය සඳහා යැවීම සුදුසු බවට සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ විස්තරය | මාසික බදු වාරික මුදල (රු) | අප්‍රේල්, මැයි, ජුනි මාස (03) සඳහා මුළු වාරික මුදල |
|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 137,000.00 | 411,000.00 |

| | | | |
|---|---|---|---|
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 173,181.82 | 519,545.46 |
| 03 | කිරින්ද පූජා නගර පැරණි හා නව වැසිකිළිය | 9,000.00 | 27,000.00 |
| 04 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 1,270.84 | 3,812.52 |
| 05 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 13,808.34 | 41,425.02 |
| 06 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 11,492.50 | 34,477.50 |
| 07 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 325.00 | 975.00 |
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 41,323.50 | 123,970.50 |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 100,642.50 | 301,927.50 |
| 10 | කිරින්ද පොදු වෙළඳපොළ | 3,750.00 | 11,250.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

මෙම කාලය තුළ රටේ පවතින තත්ත්වය හමුවේ අනෙක් දේපළ වලින් සුළු හෝ ආදායමක් ලබා ගැනීමට හැකි වුවත්, ඉහත කී මාසයන්හි තිස්සමහාරාම රථවාහන නැවතුම්පොළ සඳහා වාහන නොපැමිණීමත් සමඟ ආදායම් ලැබීමක් සිදු නොවී ඇති බැවින්, ඒ සඳහා 50% ක සහනය ලබා දීම ප්‍රමාණවත් නොවනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් අදාළ සත්‍ය වාර්තාවන් ලබා ගෙන, ඔවුන් සඳහා සාධාරණයක් වන පරිදි කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

එසේම තිස්සමහාරාම වැව් කණ්ඩියෙහි බදු මුදල් අය කිරීමේ දී එම බදුකරුට විවිධ ගැටළු සඳහා මුහුණ දීමට සිදු වනු ඇත. පසුගිය දිනක පොලිස් නිලධාරියෙකු විසින් ද තිස්සමහාරාම වැව් කණ්ඩියෙහි බදු අය නොකරන ලෙසට දන්වා ඇති බැවින්, මෙලෙසට පවතින ගැටළු සඳහා විසඳුම් ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත දේපළයන් ටෙන්ඩර් ලබා ගත් බදුකරුවන් සමඟ පසුගිය දිනක සාකච්ඡාවක් ලබා ගෙන මේ සම්බන්ධයෙන් අදහස් ලබා ගන්නා ලදී. එහිදී 2022 අප්‍රේල්, මැයි සහ ජූනි මාසයන්හි රටේ පැවැති තත්ත්වයන් නිසා ආදායම් ලැබීමක් සිදු නොවී ඇති බවට ආදායම් පරීක්ෂක නිලධාරී විසින් ද පරීක්ෂා කර බලා වාර්තා ලබා දී ඇති බැවින්, කිරින්ද සහ තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සඳහා 70% ක බදු සහනයක් ලබා දීම සුදුසු බවටත්, අනෙකුත් දේපළ 08 සඳහා 50% ක සහනයක් ලබා දීම සුදුසු බවටත් එහිදී තීරණය වූ අතර, ඒ සඳහා බදුකරුවන් ද එකඟ විය.</u>

<u>එසේම, මෙලෙස සහන ලබා දීම සම්බන්ධයෙන් අනෙක් සභාවන්වලද සහන ලබා දී ඇති බැවින්, පහත පරිදි කිරින්ද සහ තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සඳහා 70% ක බදු සහනයක් ලබා දීම සුදුසු බවටත්, අනෙකුත් ටෙන්ඩර් දේපළ 08 සඳහා 50% ක බදු සහනයක් ලබා දීම සුදුසු බවටත්, මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.</u>

| අනු අංකය | දේපළ විස්තරය | මාසික බදු වාරික මුදල (රු) | අප්‍රේල්, මැයි, ජූනි මාස (03) සඳහා මුළු වාරික මුදල | කපා හැරීම සඳහා සම්මත කරන ලද ප්‍රතිශතය | කපා හැරීම සඳහා සම්මත කරන ලද මුදල (රු) |
|---|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 137,000.00 | 411,000.00 | 50% | 205,500.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 173,181.82 | 519,545.46 | 50% | 259,772.73 |
| 03 | කිරින්ද පූජා නගර පැරණි හා නව වැසිකිළිය | 9,000.00 | 27,000.00 | 50% | 13,500.00 |
| 04 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 1,270.84 | 3,812.52 | 50% | 1,906.26 |
| 05 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 13,808.34 | 41,425.02 | 50% | 20,712.51 |
| 06 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 11,492.50 | 34,477.50 | 50% | 17,238.75 |
| 07 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 325.00 | 975.00 | 50% | 487.50 |
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 41,323.50 | 123,970.50 | 70% | 86,779.35 |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 100,642.50 | 301,927.50 | 70% | 211,349.25 |
| 10 | කිරින්ද පොදු වෙළඳපොළ | 3,750.00 | 11,250.00 | 50% | 5,625.00 |

එබැවින්, ඉහත කපා හැරීම් සඳහා බදුකරුවන්ගෙන් අදාළ ඉල්ලීම් ලිපි ලබා ගෙන, ආදායම් පරීක්ෂක නිලධාරී වාර්තාවද ලබා ගනිමින්, මහා සභාවේ සහා සම්මුතියද සමඟ සාධාරණීකරණ වාර්තාවක් සකස් කර ආදායම් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය විය.

තිස්සමහාරාම වැව් කණ්ඩියෙහි බදු අය කරන බදුකරු වෙත එම ස්ථානයේ බදු අය නොකරන ලෙස පොලිස් නිලධාරියෙකු විසින් පසුගිය දිනක දන්වා ඇත. මේ සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් යම් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරන්නේ නම්, ඊට අදාළව කටයුතු කිරීමට පොලිස් ස්ථානයට හැකියාව ඇත. නමුත් සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි කිරීමට කිසිදු නිලධාරියෙකුට හෝ පුද්ගලයෙකුට නොහැක. මේ සම්බන්යෙන් මා තිස්සමහාරාම පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා වෙත ද දන්වන ලදී. එම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි කිරීමට කටයුතු කළ මෙම පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත දන්වා යැවීම සුදුසු බවටත් තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

❖ **රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**

- **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

05. ZA-5200 බැකෝ ලෝඩරය ඔයිල් සීල් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය වන අතර, බල ප්‍රදේශයේ ආයතනවල හෝ කිසිම ආයතනයකින් අමතර කොටස් සොයා ගැනීමට නොහැකි බැවින්, නියෝජිත ආයතනය වන ඇවොන්ස්මාර්ට් ආයතනයෙන් ගෙන්වා ගෙන අදාළ අලුත්වැඩියාව කඩිනමින් සිදු කිරීමට එවා ඇති ඇස්තමේන්තු මුදල 39364.64 ක මුදල ගෙවා අදාළ අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

- මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ පී.කේ. ආරියසේන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ZA-5200 බැකෝ ලෝඩරය අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවොන්ස්මාර්ට් ආයතනය අප සභාවට පැමිණ අලුත්වැඩියාව සිදු කළ බව තාක්ෂණ සේවා නිලධාරී විසින් ප්‍රකාශ කරන ලදී.

LA-1440 ටිපර් රථයේ අලුත්වැඩියාව TATA ආයතනයෙන් සිදු කළ පසුව, ඒ සඳහා ගෙවීම් කටයුතු සිදු කර, අනෙක් අලුත්වැඩියාවන් සඳහා ආරියපාල ඔටෝ ඉංජිනියර්ස් ආයතනය වෙත ගෙන ඒමට අවශ්‍ය බව තාක්ෂණ සේවා නිලධාරී, එල්.පී. ජගත් කුමාර මහතා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ZA-5200 බැකෝ ලෝඩරය අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවොන්ස්මාර්ට් ආයතනය සම්බන්ධ කර ගැනීමට කටයුතු සිදු කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරී, එල්.පී. ජගත් කුමාර මහතා වෙත ස්තුතිය පුද කරන ලදී.</u>

- ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ එන්.ජී. සරත් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. LA-1440 ටිපර් රථයේ පුපුරණ ලද බ්ලොක් එක බෝර් කර, පුපුරණ ලද ස්ලිව් කටවල්වලට ආරක්ෂිත ස්ලිව් ගසා ස්ලිව් 4 ක් අලුතින් ගැසීම. ප්‍රෙෂර් බැලීම ආදී අලුත්වැඩියාවන් සිදු කිරීම වෙනුවෙන් ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනේරින් පීඑල්සී ආයතනය වෙත ගෙවීමට ඇති 155,232.00 ක මුදල ගෙවීම් කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම වෙනුවෙන් ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු, රු. 181,200.00 ක මුදල ගෙවීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. LM-5616 කම්පැක්ටරය හා ZB-0413 කම්පැක්ටර් රථ කසළ ප්‍රවාහනය කිරීමේ සේවා සඳහා යොදවන අතර, එම කම්පැක්ටර් 02 සඳහා ටයර් මිලදී ගැනීමට අවශ්‍ය වී ඇත. පහත සඳහන් ප්‍රමාණවල ටයර්, ටියුබ්, රිම්ටේප් මිල ගණන් කැඳවා කඩිනමින් මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| වාහනය | ටයර් ප්‍රමාණය | අවශ්‍ය ගණන |
|---|---|---|
| LM-5616 කම්පැක්ටරය | 825 x 16 | 04 |
| ZB-0413 කම්පැක්ටරය | 900 x 20 | 02 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත කී කාර්යය සිදු කිරීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ නිවැරදිව සිදු කරන ලෙසට දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. දෙබරවැව මහජන පොදු ක්‍රීඩාංගනයේ විවේකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත 162196 දරණ රු. 1,773,936.60 ක් වටිනා චෙක්පත ලැබී ඇති අතර, මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ආයතනය වන නිව් අබේනායක කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත අදාළ මුදල ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. ඉන්ධන වැය ශීර්ෂයන් සඳහා අයවැය මගින් ඉන්ධන සඳහා වෙන් කර ඇති වැය ශීර්ෂයන්හි ඉන්ධන මිල වැඩි වීමත් සමඟ වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා වියදම් කිරීමට සිදු වී ඇති බැවින්, වෙනත් ප්‍රතිපාදන පවතින වැය ශීර්යන්ගෙන් ප්‍රතිපාදන මාරු කර ගනිමින් ඉන්ධන සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>වැඩසටහන් අනුව ඉන්ධන ලබා ගැනීම සඳහා වියදම් වූ මුදල - ජූලි මස 31 දින දක්වා</u>

| වැය ශීර්ෂය | අය වැයෙන් වෙන් කළ මුදල | වියදම් වූ මුදල | වැය ශීර්ෂ අතර හුවමාරු කළ මුදල |
|---|---|---|---|
| 103-2 | 1,420,000.00 | 1,474,099.00 | 54,099.00 |
| 203-2 | 2,600,000.00 | 3,695,161.50 | 1,095,161.50 |
| 503-2 | 180,000.00 | 256,615.00 | 76,615.00 |
| 603-2 | 1,400,000.00 | 1,250,198.00 | |

<u>**අදාළ මාස 07 තුළ වැය ශීර්ෂ අනුව වියදම් කර ඇති මුදල**</u>

| **103-2** | | **203-2** | | **503-2** | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 96,558.00 | ජනවාරි | 196,625.00 | ජනවාරි | 19,965.00 |
| පෙබරවාරි | 175,528.00 | පෙබරවාරි | 282,590.00 | පෙබරවාරි | 23,170.00 |
| මාර්තු | 230,150.00 | මාර්තු | 523,060.00 | මාර්තු | 29,775.00 |
| අප්‍රේල් | 135,910.00 | අප්‍රේල් | 231,440.00 | අප්‍රේල් | 24,640.00 |
| මැයි | 349,283.00 | මැයි | 887,732.50 | මැයි | 63,025.00 |
| ජුනි | 258,160.00 | ජුනි | 832,414.00 | ජුනි | 61,760.00 |
| ජූලි | 228,510.00 | ජූලි | 741,300.00 | ජූලි | 34,300.00 |

- 2022 අය වැය සම්පාදනයේදී ඉන්ධන මිල ගණන්වලට සාපේක්ෂව ඉන්ධන සඳහා ප්‍රතිපාදන වෙන් කළද , මේ වන විට ඉන්ධන මිල විශාල ලෙස වැඩිවීම නිසා මෙලෙස වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා ගොස් ඇත.
- 603-2 සුභ සාධක වැඩසටහන් යටතේ ගම්මාන සඳහා බවුසර් මගින් ජලය සැපයීමේ ව්‍යාපෘතිය ඉන්ධන නොමැතිවීම නිසා නතර කර ඇති බැවින්, එම වැය ශීර්ෂය ඉක්මවා ගොස් නැති අතර,

ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ නම් ඉදිරි මාස 05 සඳහා ඉන්ධන සඳහා ඇස්තමේන්තු මුදල - 1,750,000.00

- 103-2 වැඩසටහන සඳහා ඉදිරි මාස 05 සඳහා ඇස්තමේන්තුගත ඉන්ධන සඳහා මුදල - 1,500,000.00
- 203-2 වැඩසටහන සඳහා ඉදිරි මාස 05 සඳහා ඇස්තමේන්තුගත ඉන්ධන සඳහා මුදල - 5,500,000.00
- 503-2 වැඩසටහන සඳහා ඉදිරි මාස 05 සඳහා ඇස්තමේන්තුගත ඉන්ධන සඳහා මුදල - 250,000.00
- **ඒ අනුව වැඩසටහන් සඳහා ඉන්ධන ලබා ගැනීමට වැය වන මුළු ඇස්තමේන්තුගත මුදල - 9,000,000.00**

අදාළ වැඩසටහන් සඳහා පුනරාවර්තන වියදම් යටතේ වියදම් දරණ බැවින් ප්‍රතිපාදන වැය ශීර්ෂ අතර හුවමාරු කිරීම සඳහා ඉතිරි වැය ශීර්ෂවලද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත.

මුදල් රෙගුලාසි ප්‍රකාරව පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් මාරු කළ නොහැකි වේ.

පරිපූරක අය වැයක් ඉදිරිපත් කිරීම සඳහා අප විසින් අය වැයට ඉදිරිපත් කළ ආදායම් ශීර්ෂවලට අමතරව ආදායම් උපයාගන්නා ආකාරයන් පෙන්වා දිය යුතු වේ. එහෙත් මේ වන විට 2022 අයවැයට ඇස්තමේන්තු කළ ස්වයං උත්පාදන ආදායම් අයවීම්ද සිදු නොවීම හා ආදායම් උපයා ගත හැකි වෙනත් ක්‍රමවේදයක් නොමැති වීම නිසා පරිපූරක අයවැයක් ඉදිරිපත් කළ නොහැකිවේ.

| | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022.07.31 දින වන විට ආදායම |
|---|---|---|
| ස්වයං උත්පාදන ආදායම | **57,713,356.00** | **37,929,969.49** |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

- **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ඉන්ධන සම්බන්ධයෙන් වන වියදම් විස්තරය පිළිබඳ සාධාරණීකරණ වාර්තාවක් සකස් කර, ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සිදු කර, ඒ සඳහා පිළිතුරු ලිපියක් ලැබුණු පසුව එකී ලිපිය නැවත මහා සභාවට යොමු කිරීමට තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් අරගලකරුවන් විසින් මාගේ නිවස හා වාහන කඩා බිඳ දැමීමට කටයුතු කරන ලදී. නමුත් මාධ්‍ය සාකච්ඡාවකදී ජනතා විමුක්ති පෙරමුණ නායකයින් විසින්, එදින සිදු වූ කඩා බැද දැමීම් අප විසින්ම සිදු කර ගෙන ඇති බවට ප්‍රකාශ කරන වැරදි මාධ්‍ය සාකච්ඡාවේ වීඩියෝව සහ අප නිවාස අරගලකරුවන් විසින්ම විනාශ කරන බවට ඇති සත්‍ය වීඩියෝව අනුව, මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ වී මේ වන විට සැඟී සිටින මහමොලකරුවන් සහ අනෙක් පිරිස් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු සිදු කරන ලෙසට අතිගරු ජනාධිපතිතුමා වෙත සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වීඩියෝව සමඟ දන්වා යැවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. 2017 වර්ෂයට අදාළව ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කිලෝ මීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැඩ නිම කරන ලද ව්‍යාපෘති 03 කට ගෙවිය යුතු රු. 267,631.00 ක් වූ 10% රඳවුම් මුදල් 2019 වර්ෂයේ දී සභා අරමුදලින් ගෙවා ඇති අතර, එම මුදල තැන්පත් මගින් සභා ආදායමට ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කර්මාන්තයේ නම | 10% රඳවුම් මුදල |
|---|---|---|
| 01 | ජුල්පල්ලම රන්මිණිතැන්න කු.ග. 09 අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 94,753.80 |
| 02 | අංක 15 යෝධකණ්ඩිය 41/4 කණුව බෝගහ අසලින් පහලට ඇති මාර්ගය | 87,071.44 |
| 03 | විහාරමහාදේවීපුර කොරියාව අතුරු මාර්ගය සංවර්ධනය කිරීම | 85,805.33 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ නගර සභා නිවාස අංක 02 හි බදු අයිතිය හිමි වී තිබු රෝහිණී වීරසිංහ මහත්මිය එම නිවසේ තව දුරටත් ජීවත් නොවන බවත්, ඇය අවිවාහක බවත් දැනට රෝගී තත්ත්වයෙන් පසුවන බැවින්, එම නගර සභා නිවාස අංක 02 හි බදු අයිතිය ඇයගේ ඥාති පුත්‍රයෙක් වන ලොකු ගීගනගේ පැතුම් අසංක සඳරුවන් යන අයට ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව, ලොකු ගීගනගේ පැතුම් අසංක යන අය ඉහත ස්ථානයේ පදිංචි වී එය භුක්ති විඳින බැවින්, එම අයට නගර සභා නිවාස අංක 02 හි බදු අයිතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>**

14. කාවන්තිස්සපුර පොළ ටෙන්ඩර් කර බදු අයිතියට ලබා දීමට ප්‍රථමයෙන් සංවර්ධන කටයුතු අවසන් කර ගැනීමට නොහැකි වූ බැවින්, අදාළ බදු දේපළ වෙනුවෙන් ටෙන්ඩර් අයදුම් කළ පුද්ගලයන්ගේ ටෙන්ඩර් ඇප සැරකුම් ගාස්තු, එම පුද්ගලයින් වෙත ගෙවීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

15. උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසමේ මහදෙයිර ප්‍රධාන මාර්ගයේ පී.එම්. ගුණදාස මහතාගේ නිවස අසල සිට ජපන් පාර දක්වා ඇති මිල්ලත්ත අතුරු මාර්ගය (ධාර්මික මාවත) කි.මී. 01 ක් පමණ ඇති අතර, එහි ආරම්භයේ සිට අවසානය දක්වා කෙටි දුරක් කැට ගල් ගල් අතුරා ඇත. තවද මෙකී මාර්ගයේ විධිමත් බෝක්කු සහ කාණු පද්ධතියක් නොමැති වීම නිසා පාර මැදින් කාණු සෑදී ඇත. එසේම මෙම මාර්ගය නව ගම්මාන 25 කට ඇතුලුවීමට ඇති ප්‍රධාන මාර්ගයක් වන නිසාත්, හේන් සහ අනෙකුත් ගොවීන් විශාල ප්‍රමාණයක් සහ යෝධ වැවට දිය නෑමට සහ නොයෙක් අවශ්‍යතාව සඳහා දිනකට 1000

කට අධික ජනතාවක් මෙම මාර්ගය භාවිතා කරන නිසා මෙකී මාර්ගය ප්‍රදේශවාසීන්ගේත්, ගොවි සංවිධානවලත්, යම් යම් ආයතනවලින් ද උපකාර ලබා ගනිමින් අලුත්වැඩියා කිරීමට මා උත්සාහ කරන බැවින්, මෙකී මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා වන තාක්ෂණික දැනුම සහ අවශ්‍ය වුවහොත් මෝටර් ග්‍රේඩරය සහ ජේ.සී.බී. යන්ත්‍රය ලබා දීමට කටයුතු කරන ලෙසත්, මෙකී මාර්ගය නඩත්තු කළ පසු තිස්සමහාරාමයේ පොදු ජනතාව විසින් නඩත්තු කරනු ලබන ආදර්ශ මාර්ගයක් ලෙස ඉදිරියේ දී ආදර්ශයක් ලබා දෙමින් නඩත්තු කිරීමට කටයුතු කරන බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

ඉහතින් සඳහන් කරන ලද මාර්ගයේ කොටසක් කැටගල් ඇල්ලූ කොන්ත්‍රාත්කරුවන්ගේ ද අධීක්ෂණය කළ අයගේ සහ මාර්ගය දෙපස සමහර පදිංචිකරුවන්ගේ නොයෙකුත් වැරදි ක්‍රියාමාර්ග නිසා මෙම මාර්ගය අබලන් වී පාර දෙපස බැද්ද මාර්ගය දක්වා වැටී ඇත. මා විසින් පස් කියුබ් 40 ක් පමණ යොදා ජේ.සී.බී. යන්ත්‍රයක් මඟින් මාර්ගය සකස් කළ නමුත්, විධිමත්ව එය සිදු නොවීම නිසා යළින් එම පස් සෝදා ගෙන ගොස් පහල ඇති බෝක්කු මාර්ග විශාල ලෙස කැඩී යාම සහ යෝධ වැව ගොඩ වීම සිදු වී ඇත.

එම නිසා මෙම මාර්ගය යම් ආයතන, සංවිධාන මගින් උදව් උපකාර ලබා ගනිමින් අලුත්වැඩියා කර ජනතාව විසින් ඉදිරියේ දී නඩත්තු කර පවත්වාගෙන යන ආදර්ශ මාර්ගයක් ලෙස පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන බැවින්, මා අනෙක් සියලුම ගරු සභිකයින්ගෙන් ද ඉල්ලා සිටින්නේ තම කොට්ඨාසය තුළ ආදර්ශවත් මාර්ගයක් පවත්වාගෙන යාමට කටයුතු සිදු කරන ලෙසයි.

මා අංජලිගල ග්‍රාම නිලධාරී වසමට අයත් මාර්ගයක් සකස් කිරීමේ කටයුතු වලදී පස් ප්‍රවාහනය කරන කිහිප අවස්ථාවක එම ප්‍රදේශයේ අරගලකරුවෙකු ලෙස පෙනී සිටින එක් පුද්ගලයෙක් විසින් එකී කාර්යය සිදු කිරීමේදී බාධා සිදු කර කිහිප අවස්ථාවකම මා වෙත පරුෂ වචනයෙන් දෝෂාරෝපණ එල්ල කරන ලදී. එසේ කරුණු ගත් කළ, මාර්ග සකස් කිරීමේ දී එම මාර්ගය අයත් ප්‍රදේශයේ ජනතාව හැකි පමණින් සහාය ලබා දුන්නද, ඒ අතර එම කාර්යය සිදු කිරීමේ දී බාධා පමුණුවන මෝඩ මිනිසුන් පිරිසක්ද ගම්මානයන්වල සිටින බව කණගාටුවෙන් ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ගරු සභික, ඒ.පී. ධම්මික මහතා මාර්ග සකස් කිරීමේ කටයුතු සිදු කිරීමේ දී ඉතාමත් ඕනෑකමින් යුතුව ඔහුගේ වාහනද ලබා දෙමින් කටයුතු කිරීම අගය කළ යුතු බවත්, එතුමා එලෙස සිදු කරන්නාවූ සේවය වෙනුවෙන් එතුමා යෝජනා කළ මාර්ගය සකස් කිරීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දීමට තීරණය විය.</u>

<u>තවද, ගරු සභික, ඒ.පී. ධම්මික මහතා විසින් අංජලිගල ග්‍රාම නිලධාරී වසමේ ගමන් කිරීමට නොහැකි අබලන් තත්ත්වයේ ඇති මාර්ගයක් සකස් කිරීමේදී එම ප්‍රදේශයේ සිටි පුද්ගලයෙක් විසින් පරුෂ වචනයෙන් එතුමන් හට දෝෂාරෝපණ එල්ල කිරීම ඉතාමත් වැරදි ක්‍රියාවකි. මහජන නියෝජිතයෙක් වන එතුමා හට පරුෂ වචනයෙන් දෝෂාරෝපණ එල්ල කළ පුද්ගලයාට විරුද්ධව නීතිමය කටයුතු සිදු කළ යුතුය. මාර්ග සකස් කිරීම, සැලසුම් කිරීම ආදී කාර්යයන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති වගකීම්ය. එසේ ප්‍රාදේශීය සභාවට අයත් කාර්යයක් කිරීමේ දී ඒ සඳහා බාධා පමුණුවන ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව නීතිමය ක්‍රියාමර්ග ගත හැකි බැවින්, මේ සම්බන්ධයෙන් දන්වා පොලිස් ස්ථානය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය විය. එසේම එම අවස්ථාවේ මාගේ දෙමාපියන්ටද විවිධ දෝෂාරෝපණ එල්ල කර ඇති බවට මා හට දැන ගැනීමට ලැබුණු බවත් කණගාටුවෙන් සඳහන් කරන ලදී.</u>

<u>එසේම ගරු සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ඉහත කී මාර්ගය සකස් කිරීම වෙනුවෙන් එතුමාගේම ටිපර් රථය ලබා දෙමින් දැඩි කැපවීමකින් යුතුව සංවර්ධන කටයුතු සිදු කර දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් එතුමාට ස්තුතිය පුද කරන අතර, එම කාර්යය කිරීමේදී එතුමාට මුහුණ දීමට සිදු වූ ගැටළුව වෙනුවෙන් කණාගටුව ප්‍රකාශ කර සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා</u>**

16. රෝහණපුර වසමේ ඇල පාර මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීමේ දී එහි අල්ලා තිබූ ඉන්ටර්ලොක් ගල් ගලවා ඉවත් කළ ආයතනය විසින් එකී කැට ගල් සභාවට ලබා ගත් බවට ඉල්ලීම් ලිපියක් ලබා දෙන ලෙසට එම ආයතනය විසින් ඉල්ලීම් කරන බැවින්, මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අදාළ ඉල්ලීම් ලිපිය ලබා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතා</u>**

මාර්ග සංවර්ධනයේ දී කැටගල් කොටසක් ප්‍රාදේශීය සභාවට රැගෙන ආ බවට කැටගල් ගලවා ඉවත් කරන ලද කොන්ත්‍රාත් ආයතනය විසින් ප්‍රකාශ කරන බැවින්, එම කැටගල් සභාවට රැගෙන ආ බවට ලිපියක්, කැටගල් ඉවත් කරන ලද කොන්ත්‍රාත් ආයතනය වෙත ලබා දීමට කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ඉහත මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද කැටගල් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා, වාර්තාවක් ලබා දෙන ලෙසට තාක්ෂණ සේවා නිලධාරීට උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

17. සභාවේ ආදේශක සේවකයෙකු ලෙස සේවය කළ තිලකසිරි මහතා පසුගිය දිනක රෝගාතුර තත්ත්වයෙන් සිටි බැවින්, සේවය සඳහා වාර්තා කිරීමට නොහැකි විය. ඔහු දැනට නීරෝගී තත්ත්වයෙන් පසුවන බැවින් ඔහු සඳහා නැවත සේවය ලබා දීමට හැකියාවක් පවතින්නේ නම්, ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>තිලකසිරි මහතා හට සභාවේ ආදේශක තනතුරක් ලබා දෙන ලද්දේ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ ද එකඟතාවය ලබා ගනිමින්ය. එලෙසට ඔහු සේවය සඳහා යොදවා ගත්තද ඔහුගේ බීමත්කම නිසා ඔහු රැකියාවට සුදුසු නොවන පුද්ගලයෙක් ලෙසට පත් වී ඇත. ඔහු රෝගාතුර වී සිටි නිසා රැකියාව සඳහා පැමිණීමට නොහැකි වුවත්, මේ වන විට රටේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ සභාවේ ආදායමද ඉතා පහල මට්ටමක පවතින නිසා, ආදේශක සේවකයින්ගේ සේවය තාවකාලිකව නවතා ඇති බැවින්, නැවත එම සේවකයින් සඳහා රැකියා අවස්ථාව ලබා දීමේදී තිලකසිරි මහතා සම්බන්ධයෙන් ද සලකා බලා කටයුතු කළ හැකි බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

✓ 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව මගින් අරගලකරුවන් විසින් මාගේ නිවස හා වාහන කඩා බිඳ දැමීමට කටයුතු කළද, පදුගිය දිනක එම බිඳ දැමීම් අප විසින්ම සිදු කර ගත් බවට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මහතා සහ අප සභාවේ ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා විසින් මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කරන ලද වැරදි මාධ්‍ය විකාශය සහ 2022.05.09 වන දින අප නිවාස කුඩු කර දැමීම් පිළිබඳ පවතින සත්‍ය වීඩියෝව අද දින සියලුම ගරු සභිකයින්ගේ දැන ගැනීම සඳහා මේ අවස්ථාවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

✓ එසේම මෙම වීඩියෝ පටය ප්‍රදර්ශනය කිරීමේ දී මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාව සංවිධානය කළ ජනතා විමුක්ති පෙරමුණ ගරු සභික, ආර්.රජිත ප්‍රියදර්ශන මහතා මහා සභාවෙන් නික්ම යාමට කටයුතු කිරීම කණගාටුවට කරුණක් බවත් ප්‍රකාශ කර සිටින ලදී.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.08.03 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.08.03 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.08.03 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.08.03 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් හේතුවෙන් මාගේ නිවස සහ දේපළ කුඩු කර දමා විනාශ කිරීමට කටයුතු කරන සියලුම පිරිස අත්අඩංගුවට ගත යුතුය. එකී පිරිස අතරින් මේ වන විට 30-40 ක පමණ පිරිසක් අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත. මෙකී විනාශකාරී ක්‍රියාවන් සිදු කළ ප්‍රචණ්ඩකාරීන් විසින් මාගේ පුතාගේ නමින් Facebook ගිණුමක් සාදා මාගේ නිවසේ තිබූ වාහන කඩා බිඳ දැමීමේ සිදුවීම අප විසින්ම සිදු කර ගෙන ඇති බවට වැරදි පුවතක් මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම ඉතාමත් වැරදි පුවතකි. මෙම සිදුවීමට සම්බන්ධ පුද්ගලයින් ද වහාම අත්අඩංගුවට ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම 2022.05.09 වන දින මාගේ නිවස සේම, ගරු අමාත්‍ය වමල් රාජපක්ෂ මැතිතුමාගේ නිවස, ගරු සභික චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවියගේ නිවස සහ කැලුම් ප්‍රියංකර මහතාගේ නිවස, ඉන්දික මහතාගේ නිවස, චින්තක මහතාගේ නිවස ආදිය කඩා බිඳ දැමීමටත්, ගරු සභික ටෂිත සමිල මහතාගේ නිවස ගිණි තබා විනාශ කිරීමටත් කටයුතු කළ පිරිස් වෙන් වෙන් වශයෙන්

අත්අඩංගුවට ගත්තද, මෙම පිරිස් සියලුම දෙනා එදින සිදු කළ සියලුම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට සම්බන්ධ වී සිටි පිරිස් ලෙස හඳුන්වා දිය හැකිය.

තවද, මෙම සිදුවීමට සම්බන්ධ වී සිටින පිරිස අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත. එදින නිවසේ සිටි පුද්ගලයෙක් මෙම සිදුවීමට සම්බන්ධ යැයි සිතා පොලිස් අත්අඩංගුවට ගෙන ඇත්නම්, ඔවුන් වෙනුවෙන් මා හට පෙනී සිට සාධාරණයක් ඉටු කර දිය හැකි බවත්, මෙම සිදුවීමට සම්බන්ධ අන් කිසිදු පුද්ගලයෙක් වෙනුවෙන් කිසිදු අවස්ථාවක පෙනී නොසිටින බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම මෙම සිදුවීමට සම්බන්ධ මහමොලකරුවන් සහ තවත් පුද්ගලයින් පිරිසක් අත්අඩංගුවට ගැනීමට සිටින බැවින්, ඔවුන් වහාම අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට අතිගරු ජනාධිපතිතුමා වෙත සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට කටයුතු සිදු කළ යුතුය.

එසේම 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව සංවිධානය කළ ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති සහ ගරු සභික ආර්. රජිත ප්‍රියදර්ශන මහතා, මෙකී සිදුවීම නිවැරදි කිරීම සඳහා අප විසින් මෙකී ක්‍රියාව සිදු කළා යැයි යනුවෙන් මාධ්‍යයට ප්‍රකාශ කළ වැරදි පුවත හේතුවෙන් ඔවුන්ට විරුද්ධව වින්දිතයින් ආරක්ෂා කිරීමේ පනත යටතේ නඩුවක් ගොණු කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවකදී ජනතා විමුක්ති පෙරමුණ නායකයින් විසින්, එදින සිදු වූ කඩා බැද දැමීම් අප විසින්ම සිදු කර ගෙන ඇති බවට ප්‍රකාශ කරන වැරදි මාධ්‍ය සාකච්ඡාවේ වීඩියෝව සහ අප නිවාස අරගලකරුවන් විසින්ම විනාශ කරන බවට ඇති සත්‍ය වීඩියෝව අනුව, මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ වී මේ වන විට සැංගී සිටින මහමොලකරුවන් සහ අනෙක් පිරිස් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු සිදු කරන ලෙසට අතිගරු ජනාධිපතිතුමා වෙත සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමටත් කටයුතු කරන බව දන්වා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>

අප පක්ෂයේ නායකතුමාට රටේ අතිගරු ජනාධිපති ධූරය හිමි වීම වෙනුවෙන් එතුමන්ට මා හදවතින්ම සුභ පැතුම් එක් කරන ලදී. එසේම වර්තමාන අතිගරු ජනාධිපතිතුමා විශ්වාසයේ තබා ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීන් කටයුතු කිරීම පිළිබඳවත් එතුමන්ලාට ස්තූතිය පුද කරන අතර, අප සියලුම දෙනා ද අතිගරු ජනාධිපතිතුමාට අප රට ගොඩ නැගීම සඳහා සහාය ලබා දිය යුතු බවත් ප්‍රකාශ කර සිටින ලදී. එසේම අප රටේ පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය අවම කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමාට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා වන රනිල් වික්‍රමසිංහ මැතිතුමා හට රටේ අතිගරු ජනාධිපති ධූරය හිමි වීමේ සතුට නිමිත්තෙන් එක්සත් ජාතික පක්ෂයේ ගරු සභික ඒ.ඩබ්. නන්දා මහත්මිය විසින් අද දින මහා සභාවට තේ පැන් සංග්‍රහය ලබා දීමට කටයුතු කර ඇති අතර, ඒ වෙනුවෙන් එතුමියට ස්තූතිය පුද කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>

තම ප්‍රදේශයට අයත් නිමලව ආරණ්‍යයේ නායක ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සහ එම මැතිණියත්, ගරු සභාපතිතුමාත් සහභාගී

වීම පිළිබඳව එම ආරණ්‍යයේ දැනට වැඩ බලන නායක ස්වාමීන් වහන්සේ විසින් ස්තුතිය පුද කළ බව ප්‍රකාශ කරන ලදී.

එසේම නිමලව ආරණ්‍ය සේනාසනයේ ඇති විරී පහන් කිහිපයක් වඳුරන් විසින් කඩා දමා ඇති බැවින්, එම විරී පහන් කිහිපය සකස් කර දෙන ලෙසට දැනට වැඩ සිටින නායක ස්වාමීන් වහන්සේ ඉල්ලීම් කළ බැවින්, එකී විරී පහන් කිහිපය සකස් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කර දමන ලද වීඩියෝව අද දින දැක ගැනීමට හැකි වුවත්, එය දැකීමෙන් ඉතාමත් වේදනාකාරී තත්ත්වයක් ඇති විය. අපත් සමඟ එකට සිටින ගරු සභිකයන්ට මෙවැනි විනාශයක් කිරීමට කටයුතු සැලසුම් කළ හැකිද යන්නත් සිතා ගත නොහැක. ඕනෑම කෙනෙක් නිවසක් සාදා ගන්නා ලද්දේ, වාහනයක් ලබා ගන්නා ලද්දේ ඔවුන් ඉතාමත් දුක් මහන්සියෙන් හරි හම්බ කර ගත් මුදලින්ය. එසේ දුක සේ ලබා ගත් දේවල් මෙලෙස විනාශ වීම කිසිදු අයෙකුට දරා ගත නොහැකි වනු ඇත. එම නිසා මෙම සිදුවීමට සම්බන්ධ සියලුම පිරිස අනිවාරයෙන්ම අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ යුතුය.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>**

ආදාහනාගාරයේ විශාල වශයෙන් අබලි භාණ්ඩ, ෂීට් කොළ, ලී ආදී බඩු බොහෝ ප්‍රමාණයක් ගොඩ ගසා ඇති අතර, ට්‍රැක්ටර් 06 ක් සහ ට්‍රේලර් 06 ක් ද තිබෙනු ඇත. එම නිසා මෙලෙසට ගොඩ ගසා ඇති භාණ්ඩ විධිමත් පරිදි වැඩපිළිවෙලක් සකස් කර, ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් දන්වා සිටින ලදී.

මා නව නිවසක් සාදා එහි පදිංචි වීම නිමිති කර ගෙන දානයක් සහ පිරිත් පිංකමක් 2022.08.20 වන දින පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති බැවින්, ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභිකයින් සියලුම දෙනාටත්, ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුම දෙනාටත්, මාධ්‍ය වේදීන් දෙපලටත් ඒ සඳහා සහභාගී වන ලෙසට ආරාධනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සම්ල මහතාගේ අදහස් දැක්වීම</u>**

මීට මාස කිහිපයකට කලින් මා ද නව නිවසක් සාදා එය පදිංචි වීම නිමිති කර ගෙන ලබා දුන් දානය සහ පිරිත් දේශන සඳහා මෙම සභාවේ සියලුම දෙනාට ආරාධනා කරන ලදී. නමුත් නිවස පදිංචි වී දින කිහිපයකට පසු මා දුක් මහන්සියෙන් සාදා ගත් නිවස ගිණි බත් කර අලු ගොඩක් බවට පත් කර දැමීමට තරම් ප්‍රචණ්ඩකාරී මිනිසුන් පාපතර වී ඇත. මා හට එසේ අවාසනාවන්ත සිදු වීමක් සිදු වුවත් ගරු සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා ද නව නිවසේ පදිංචි වීමට යන බැවින්, එතුමාට කිසි දිනක එවැනි අවාසනාවන්ත සිදුවීමක් සිදු නොවේවායි ප්‍රාර්ථනා කරන ලදී.

2022.05.09 වන දින සිදු වූ අරගලකාරී ක්‍රියාවට සම්බන්ධ අය දැනටත් නිදැල්ලේ සිටී. එම නිසා අනිවාරයෙන්ම එම පිරිස් සහ එහි මහමොලකරුවන් අනිවාරයෙන්ම අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ යුතුය. මෙලෙස විනාශකාරී ක්‍රියාවක් සිදු වී තිබියදීත් මේ සඳහා නිසි දඬුවම් ලබා නොදෙන්නේ නම්, ඉදිරියටත් මෙම සිදුවීම් පූර්වාදර්ශයට ගෙන කටයුතු කරනු ඇත.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ නායකයින් විසින් පසුගිය දිනක සිදු කළ මාධ්‍ය ප්‍රකාශයේ සඳහන් කරන්නේ 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ යැයි නීතියේ රැහැනට අසු කර ගෙන සිටින අසරණ මිනිසුන් නිදහස් කිරීමට කටයුතු කරන ලෙසයි. මෙලෙස ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් සිදු කළ පිරිස් අසරණ මිනිසුන් යැයි පවසමින් ඔවුන් වෙත සාධාරණ ඉටු කිරීමට යන්නේ ද මෙම සිදුවීම සැලසුම් කරන ලද මහමොලකරුවන්මය. එම නිසා මෙම සිදුවීම සැලසුම් කර ඇති, තවමත්

නිදැල්ලේ සිටින මහමොලකරුවන් අනිවාරයෙන් නීතියේ රැහැනට අසු කර ගැනීමට කටයුතු කළ යුතුය.

නීතියද මේ වන විට නිහඩ වී ඇත. එය එසේ වීමට නොදී අදාළ වැරදිකරුවන් වහාම අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ යුතුය. මාගේ නිවස සම්පූර්ණයෙන් ගිණිබත් කර දැමීමට කටයුතු කළ පිරිස අත්අඩංගුවට ගැනීමට කටයුතු කළද, ඔවුන් දවස් 02 න් නැවත එළියට පැමිණ ඇත. එය එසේ සිදු වීමෙන් වැරදිකරුවන්ට නිසි දඬුවමක් ලැබී නොමැති බවත්, අපට කිසිදු සාධාරණයක් ඉටු වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එම නිසා මෙකී සිදුවීම් සම්බන්ධයෙන් නිවැරදි නීතියක් ක්‍රියාත්මක වීමට නම්, මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා වෙත ලිඛිතව දන්වා යැවීම සුදුසු වන බවත් මා ප්‍රකාශ කර සිටින ලදී.

යම් යම් දේශපාලන මතවාද නිසා 2022.05.09 වන දින අප නිවාස ගිණි බත් කර දැමීමට ප්‍රචණ්ඩකාරී මිනිසුන් කටයුතු කරන ලදී. දේශපාලන තත්ත්වය නිසා අපට මෙසේ සිදු වුවත් මේ වන තෙක් අප නිවාස සකස් කර ගැනීමට වන්දි මුදලක් ලබා ගැනීමට නොහැකි වී ඇත. අප නිවස තුළ පවුලේ අය සමඟ එකට ජීවත් වීමට හිතේ සතුටක් තිබුණත්, තවමත් නිවස සකස් කර ගැනීමට මා හට නොහැකි වී ඇත. එම නිසා ගරු සභාපතිතුමා, ගරු සභික චතුමිණි දිල්ෂාණි මෙනවියගේ සහ මාගේ විනාශ වූ නිවාස සකස් කර ගැනීමට වන්දි මුදලක් ලබා ගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කරවීම සුදුසු බව දන්වා සිටින ලදී.

2022.05.09 වන දින සිදු වූ අරගලකාරී ක්‍රියාවන්ට මෙම ප්‍රදේශයේ උපකාරක පන්ති 02 ක සිසුන් බොහොමයක් සහභාගී වී ඇත. මෙම උපකාරක පන්ති 02 හිම ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන් විසින් ළමුන් සඳහා දේශපාලනය උගන්වා, ළමුන්ට දේශපාලන වෛරය පතුරවනු ලබයි. එසේම මෙම උපකාරක පන්ති 02 හි හිමිකරු ද මෙම විනාශකාරී සිදුවීමට සම්බන්ධ මහමොලකරු නිසා, මෙකී උපකාරක පන්ති සම්බන්ධයෙන් සොයා බැලිය යුතුය. නැතහොත් ඉදිරියේ දී අප තරුණ පරපුර සහ දරු පරපුර වෛරය පුරෝගත් වෛරී සහගත පරපුරක් වීමට ඉඩ පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

මෙලෙස දේශපාලන තත්ත්වයන් උගන්වා දරුවන්ගේ මනස විකෘති කරන උපකාරක පන්ති 02 පිළිබඳව මා හිටපු අතිගරු ජනාධිපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවකදී ද අදහස් දක්වන ලදී. එම අවස්ථාවේම අතිගරු ජනාධිපතිතුමා විසින් රහස් පොලිසිය (CID) සඳහා මෙකී තොරතුරු දන්වා පරීක්ෂණයක් සිදු කරන ලෙසට දැන්වීමට කටයුතු කළද, ඒ සඳහා ක්‍රියාත්මක වීමක් මෙතෙක් සිදු වී නොමැත. එම නිසා මේ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයන් වෙත දන්වා අපගේ අනාගත දරු පරපුර රැක ගැනීමට අප සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතුය. නැතහොත් ඉදිරියේ මෙම උපකාරක පන්ති තුළින් දරුවන් හට වෛරය පතුරවා දරුවන්ගේ අනාගතය විනාශ විය හැකි බවත් ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>

2022.05.09 වන දින අරගලකරුවන් විසින් ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කර දමා යන වීඩියෝ පට අද දින අප සියලුම දෙනාගේ ඇසින් දැක ගැනීමට හැකි විය. එම වීඩියෝ පට බැලීමේ දී එම විනාශකාරී මිනිසුන් ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කර, ඉන් පසුව විනාශ කිරීම සඳහා යන නිවාස පිළිබඳවද එම ස්ථානයේ දීම ප්‍රකාශ කරනු ඇත. මෙම සිදුවීම් අතරේ බුද්ධි අංශයේ නිලධාරීන්, ආරක්ෂක අංශ නිලධාරීන් සිටියද, ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කිරීම නවතා දැමීමට සහ ඊළඟට වන විනාශය වළකාලීමට එම නිලධාරීන් ක්‍රියාත්මක නොවූයේ මක් නිසාද යන්න ගැටළුවට කරුණකි. එම නිසා මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

2022.05.09 වන දින සිදුවීම් වලදී ත්‍රිවිධ හමුදාව, පොලිස් ස්ථානවල නිලධාරීන් සිටියදීත් මෙකී විනාශකාරී තත්ත්වයන් වැළැක්වීමට මැදිහත් වීමට කටයුතු නොකිරීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදී.

මෙම විනාශකාරී සිදු වීමෙන් ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ නිවස සම්පූර්ණයෙන්ම ගිණි බත් කර ඇත. ඒ හේතුවෙන් එතුමාට අද වන විට ඉන්න හිටින්න තිබූ නිවස අහිමි වී ඇත. අප රටේ පැවැති දැඩි බාධක හමුවේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමා රටේ වගකීම භාර ගෙන මේ වන විට කටයුතු කිරීම පිළිබඳව සතුටු වනවා සේම අතිගරු ජනාධිපතිතුමන්ට ඒ සම්බන්ධයෙන් මාගේ ගෞරවණීය ස්තූතිය පුද කර සිටින ලදී. එසේම ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාටත්, චතුමිණි විජේනායක මෙනවියටත් සිදු වූ හානිය වෙනුවෙන් අප හට සිදු කිරීමට යම් දෙයක් ඇත්නම්, ඒ සෑම දෙයකදීම අපගේ සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී. එසේම මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් වෙත දන්වා යම් සහනයක් ලබා ගැනීමට හැකිද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසු බවත් දන්වා සිටින ලදී.

ගෑස් මිල යම් මුදලකට හෝ අඩු කර තිබියදී, මෙම ප්‍රදේශයේ වෙළඳසැල්වල රු. 6,000.00 ගෑස් අලෙවි කරනු ලබන බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

ගරු සභාපතිතුමා හොඳ නායකයෙක් සේම හොඳ මනුස්සකම් ඇති උතුම් පුද්ගලයෙකි. අපගේ ධූර කාලය අවසන් වීමට තවත් කෙටි කාලයක් තිබුණද, අප කාලය තුළ ගරු සභාපතිතුමා විසින් බල ප්‍රදේශය වෙනුවෙන් සිදු කරන ලද සේවාවන් අගය කළ යුතුය. එසේම අපගේ ධූර කාලය තුළ මෙම මහා සභාව තුළ කිසිදු ගැටුමක් ඇති කර නොගෙන කටයුතු කිරීමට හැකි වීම සම්බන්ධයෙන් තමාට සතුටු විය හැකිය. එසේම අප ධූර කාලය අවසන් වුවත් ගරු සභාපතිතුමා සමඟ තිබූ සහෝදරකම කිසි දිනක අත් නොහරින බවද සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>2022.05.09 වන දින සිදුවීම්වලදී පොලිස් නිලධාරීන්, බුද්ධි අංශයේ නිලධාරීන් ක්‍රියාත්මක වීමක් සිදු නොවීම පිළබිදව මා පොලිස් අධිකාරීතුමාට ද දන්වන ලදී. එහිදී රඹුක්කන සිදුවීමේ දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා රක්ෂිත බන්ධනාගාර ගත කිරීම තුල සියලුම පොලිස් නිලධාරීන්ට ආයුධ නොමැතිව උද්ඝෝෂණ පාලන කරන ලෙසට නියෝගයක් ලබා දී ඇත. ආයුධයක් නොමැතිව උද්ඝෝෂණය පාලනය කිරීමේ දී නිලධාරීන්ට ගැටුම්වලට මුහුණ දීමට සිදු වන බැවින්, නිලධාරීන් මේ සඳහා මැදිහත්වීමක් සිදු කර නොමැත. ත්‍රිවිධ හමුදාවට යම් නියෝගයක් ලබා දිය යුත්තේ හමුදාපති විසින්ය. නමුත්, පොලිස් ආඥා පනත යටතේ සඳහන්ව ඇත්තේ සාමය කඩ වන ඕනෑම අවස්ථාවක නියෝගක් නොමැති වුවත් ඊට අදාළ කටයුතු සිදු කිරීමට පොලිස් නිලධාරීන්ට බලය හිමිව ඇති බවයි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ද අවධානය යොමු කර සොයා බැලිය යුතු බව ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>

අද දින මහා සභාවේ දී රට තුළ පැවැති බේදවාචක තත්ත්වයන් පිළිබඳ කතා කරන ලදී. පළමුව ගත් කළ අරගලකරුවන් විසින් 2022.05.09 වන දින රටේ ගරු අගමැති එම ධූරයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. එසේම 2022.07.09 වන දිනත් අරගලකරුවන් විසින් රටේ ප්‍රභල දේශපාලන නායකයින් ධූරවලින් ඉවත් කිරීමටත්, රටේ අතිගරු ජනාධිපතිතුමා රටින් පලවා හැරීමටත් කටයුතු සිදු කරන ලදී. පසුව, එකී සෑම දෙයක්ම සිදු කළ අරගලකරුවන්ව පලවා හැරීමට 2022.08.09 වන දින කටයුතු සිදු විය. රටේ පැවැති අරගලකාරී තත්ත්වයන් මාධ්‍ය තුළින් දැක බලා ගැනීමට හැකි වුවත්, සිදු කරන ලද අරගලකාරී තත්ත්වයන් සැබෑම අරගලද යන්න සිතිය නොහැක.

ගරු සභාපතිතුමාගේ සහ අප සභාවේ හිටපු උප සභාපතිවරයෙකුගේ පුතණුවන් වන ගරු සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ චතුමිණි විජේනායක මෙනවියගේ නිවාස කුඩු කර ගිණි

බත් කර දැමීමට අරගලකරුවන් කටයුතු කළද, ඒවා ඔවුන් දහඩිය මහන්සියෙන් හරි හම්බ කර ගත් මුදලින් සකස් කර ගත් දේවල් බව සඳහන් කළ යුතුය. ගරු සභාපතිතුමාගේ නිවස කුඩු කරන සිදුවීම දැක බලා ගැනීමේ දී එය අරගලයට එහා ගිය ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් ලෙස කිව හැකිය. මෙම අරගලයේ සිටියේ අරගලකරුවන් නොව, ත්‍රස්තවාදීන් පිරිසකි. අප ප්‍රදේශයේ සිදු වූ සිදුවීම් වලට අමතරව රට පුරාම මෙලෙස විනාශකාරී ක්‍රියාවන් අරගලකරුවන් විසින් සිදු කරන ලදී. ඒ අතර ජනාධිපති මන්දිරය, අගමැති නිල නිවාසය, අරලියගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය, වර්තමාන අතිගරු ජනාධිපතිතුමාගේ පෞද්ගලික නිවාස, මැති ඇමතිවරුන්ගේ නිවාස, සමාජ සේවකයින්ගේ නිවාස, පොදු දේපළ විනාශ කළ මෙම පුද්ගලයින් අරගලයේ මුවෙන් ත්‍රස්තවාදී ක්‍රියාවන් සිදු කර ඇති බව කිව යුතුය. මේවා ඉතාමත් වැරදි ක්‍රියාවන්ය. අරගල සිදු කරන්නේ මිනිස් අයිතිවාසිකම් දිනා ගැනීමටය. එසේ සිදු කරන අරගල අවිහිංසාවාදි විය යුතුය. එසේ නොමැතිව අරගලයේ මුවාවෙන් සිදු කරන්නා වූ විනාශකාරී ක්‍රියාවන් ත්‍රස්තවාදී ක්‍රියාවන් ලෙස දකින බව ප්‍රකාශ කරන ලදී.

රටේ පවතින අර්බුදකාරී තත්ත්වයන් හමුවේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමා රට භාර ගෙන කඩා වැටී ඇති රට ගොඩ නැගීම සඳහා ගත් තීරණය ඉතාමත් හොඳ දෙයකි. හිටපු අතිගරු ජනාධිපතිතුමා විසින් අගමැති ධූරය භාර ගැනීමට දේශපාලන නායකයින්ගෙන් ඉල්ලීම් කිරීමේ දී යම් යම් නායකයින් ඒ සඳහා විවිධ කොන්දේසි දමන ලදී. නමුත් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා කොන්දේසි විරහිතව රට භාර ගැනීමට කටයුතු කරන ලදී. එතුමා කළ එම ක්‍රියාව අප අගය කළ යුතුය. ඉන් අනතුරුව ගරු එතුමන්ට රටේ අතිගරු ජනාධිපති ධූරය හිමි වීමෙන් පසු ජාත්‍යන්තරය සමඟ සම්බන්ධ වී රටේ පැවැති ඉන්ධන ගැටළුව, ගෑස් ගැටළුව සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා වැඩි වූ මිල අවම කිරීමට කටයුතු කරන ලදී. මෙකී කරුණු ගත් කළ රට ගොඩ ගැනීමට අතිගරු ජනාධිපතිතුමා දැඩි කැපවීමක් සිදු කරන ලදී. එලෙසට ඉදිරියටත් රටේ ජනතාවට යම් සහනයක් ලැබෙන පරිදි අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරනු ඇතැයි විශ්වාස කරමි.

රට තුළ නැවත වතාවක් 2022.05.09, 2022.07.09, 2022.08.09 දිනයන්හි සිදු වූ පරිදි අරගලකාරී තත්ත්වයක් ඇති වීමට ඉඩ නොදිය යුතුය. රටේ සිටින සියලුම ජනතාවට එක හා සමාන අයිතිවාසිකම් තිබෙන බැවින්, එකී සියලු අයිතිවාසිකම් රැකෙන පරිදි වැඩපිළිවෙලක් අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සකස් කරන බවට, විශ්වාසයේ තබා රට ගොඩ නැගීමට කොන්දේසි විරහිතව අතිගරු ජනාධිපතිතුමා වෙත අපගේ සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

එසේම රටේ පැවැති අර්බුදකාරී තත්ත්වයන් හමුවේ රට භාර ගැනීමට කටයුතු කළ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභික මඩුල්ලේ සහ අප ප්‍රාදේශීය සභාවේම උත්තමාචාරය පුද කරන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

එසේම පත් වූ නව ගරු අගමැතිතුමා දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලනය වෙනුවෙන් කටයුතු කළ නායකයෙකි. ගරු එතුමන්ද අතිගරු ජනාධිපතිතුමා සමඟ එක්ව කඩා වැටුණු රට ගොඩ නැගීම සඳහා කටයුතු කරනු ඇතැයි විශ්වාසයේ තබා ගෙන ගරු එතුමන්ට ලබා දිය යුතු සහායද අප ලබා දිය යුතුය.

අප රට නිවැරදිව ඉදිරි ගමනක් යාමට නම් රටේ නීතිය ද එකක් විය යුතුය. එසේ වුවහොත් මෙම අරගලකාරී ක්‍රියාවන් ද නතර කර දැමිය හැකිය. අප ප්‍රදේශයේ අරගලකාරී විනාශයන් සිදු කළ ත්‍රස්තවාදීන් මේ වන විට සැංගී සිටින බැවින්, පවතින සත්‍ය වීඩියෝ පට සහිතව අතිගරු ජනාධිපතුමා වෙත සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා සැංගී සිටින ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගෙන ඔවුන්ට නිසි දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතුය. එසේම ජනාධිපති මන්දිරය, අගමැති නිල නිවාසය, අරලියගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය ආදිය විනාශ කර දැමූ පුද්ගලයින් සඳහා නීතිය ක්‍රියාත්මක වී ඔවුන් නීතියේ රැහැනට අසු කර ගැනීමට කටයුතු කර ඇත. එම නිසා එම නීතියම අප ප්‍රදේශයේත් ක්‍රියාත්මක කරන්නේ නම් අප ප්‍රදේශයේ ත්‍රස්තවාදීන් ද නීතියට අසු කර ගත හැකි බවත්, එසේ වුවහොත් අප රටේ එක් නීතියක් පවතින බව පිළිගත හැකි බවත් ප්‍රකාශ කර සිටින ලදී.

මහජන නියෝජිතයෙක් ලෙස අප ප්‍රාදේශීය සභාවට තේරී පත්ව දැනට වසර 04 ක කාලයක් නිමා වෙමින් පවතී. අපගේ එම පාලන කාලය තුළ සිදු කළ සේවාවන් පිළිබඳව සතුටු විය හැකි වුවත්, ජනතාවට සේවාවන් රැසක් ලබා දීමට නොහැකි විය. රට තුළ පැවැති සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වය සහ රට තුල පැවැති ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් නිසා වැඩි

සේවාවන් ප්‍රමාණයක් ජනතාවට ලබා දීමට නොහැකි විය. එම නිසා 2023 අයවැය මගින් හෝ ජනතාවට වැඩි සේවාවන් රැසක් ඉටු කර දීමට අතිගරු ජනාධිපතිතුමාගේ ද සහාය ලබා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

අරගලයේ නාමයෙන්, සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට සම්බන්ධ සියලුම දෙනාට නිසි දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතුය. එසේ කටයුතු කිරීමේ දී ඊට ලබා දිය යුතු ඕනෑම සහායක් අප ලබා දීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කර සිටින ලදී.

අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දේශපාලන දැක්ම අනුව රට ගොඩ නැගිය හැකි බැවින්, එතුමන්ට කොන්දේසි විරහිතව අප රට ගොඩ නැගීම සඳහා සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරී ඇතුළු සියලුම සේවක මහත්ම මහත්මීන්ගේ සුභ සාධනය වෙනුවෙන් සහ ඔවුන්ගේ මානසික සුවය පිණිස සේවක සුභ සාධක සංගමයෙන් අවශ්‍ය මුදල් ලබා ගෙන විනෝද චාරිකාවක් යාමට තීරණය කර ඇත. මේ සඳහා ගරු සභික මහත්ම මහත්මීන් ද සහභාගී කර ගැනීමට කටයුතු කරනු ඇත. අප මහා සභාවේ සහ කමිටුවල ගනු ලබන තීරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වන්නේ ආයතනයේ නිලධාරී/සේවක මහත්ම මහත්මීන් ලබා දෙන සහයෝගය නිසාවෙන්ය. එම නිසා සේවකයින්ගේ සුභ සාධනය වෙනුවෙන් මෙකී කටයුත්ත සිදු කළහොත් අප පාලන කාලය තුළ ප්‍රාදේශීය සභාවේ නිලධාරී/ සේවක මහත්ම මහත්මීන්ගේ සුභ සාධනය සඳහා අප කටයුතු කලා යැයි සතුටු විය හැකිය. එම නිසා කඩිනමින් මෙම විනෝද චාරිකාව සංවිධානය කරන ලෙසට ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදී. එසේම සුභ සාධක සංගමයේ මහා සභාව කඩිනමින් කැඳවා, අවශ්‍ය තීන්දු තීරණ ලබා ගෙන මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට කටයුතු කරන ලෙසද උපදෙස් ලබා දෙන ලදී.

2022.05.09 වන දින සිදු වූ අරගලය සඳහා සම්බන්ධ වූ අරගලකරුවන් සඳහා කොවිඩ් රෝගය රට පුරා සේම අප ප්‍රදේශයේ ද ව්‍යාප්ත වූ කාලයේ කොවිඩ් එන්නත් මාත්‍රා ලබා දීමට මැදිහත් වී කටයුතු කරන ලදී. එසේම කිසිදු අවධානමක් නොතකා නිරෝධායනය වන අවස්ථාවල බඩු මලු ලබා දීමට ද කටයුතු කරන ලදී. එසේම කොට්ඨාස භාර ගරු සභිකයින් ද කිසිදු පාට පක්ෂ භේදයක් නොබලා කොට්ඨාසවල සියලුම දෙනාට එන්නත් ලබා දීමට කටයුතු කරන ලද අතර, එසේ එන්නත් ලබා දීමේ වැඩසටහන්වලදී වැඩසටහන සඳහා දායකත්වය ලබා දෙන සියලුම නිලධාරීන් සඳහා ආහාර පාන ලබා දෙමින් එකී වැඩසටහන දවසපුරා පවත්වාගෙන යන ලද්දේ අප ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්ය. නමුත් එම ජනතාවම අප හට ගල් ගැසීමට කටයුතු කරන ලදී. ඔවුන් සිදු කරන ලද මෙම ක්‍රියාවන්ට ඔවුන්ට බුදු දහම අනුව ඵල විපාක යම් දිනක ලැබෙනු ඇත.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, මාධ්‍යවේදී දෙපටත් ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 01.00 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුචිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.08.12 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.